සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 3 | 04. පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය |



සැකසුම - එස්.ඒ.ඩී. චතුරි සමරවීර

බප/හො/ දොන් පේද්‍රික් මහා විද්‍යාලය

# පරිසරය පිළිබඳ මත හා නිර්වචන



❖ අප පෘථිවියේ කොටසක් වන අතර එය අපේ ම කොටසකි.
සුවඳැති මල් වර්ග අපේ සහෝදරයෝ වෙති .
මුවා ,අශ්වයා ,රාජාලියා අපේ සහෝදරයෝ වෙති.
අශ්වයාගේ මිනිසාගේ ගත උණුසුම මේ හැම දෙයක්ම අයත් වන්නේ එකම පවුලක සාමාජිකයන්ටය.

**- සියැටල් ප්‍රකාශනය-1954-**

❖ පරිසරය යනු ජීවියකු වටා පවතින භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක තත්ත්වයන්ය.

**-පරිසර ශබ්ද කෝෂය-**

- පරිසරය යනු ජීවි අජීවි සංරචක වල සංකලනයකි.
- ඒ අනුව මිනිසා ඇතුළු සියලු සත්වයින් ද ශාක ප්‍රජාව ද ඇතුළු සජීවී අජීවී සියල්ලම පරිසරයට අයත් වේ.
- මේ සියල්ල එකිනෙක අතර විවිධ හා සංකීර්ණ අන්තර් සම්බන්ධතා පවත්වයි.
- මෙම අන්තර් සම්බන්ධතා මගින් පරිසරයේ පැවැත්ම හා ක්‍රියාවලි සිදුවේ .



# පරිසරයේ ප්‍රභේද

- **ජෛව පරිසරය**

පෘථිවියේ ඇති මිනිසා ඇතුළු සතුන්,ශාක, ක්ෂුද්‍රජීවී කොටස් ඇතුළත් ඉතා තුනී ස්ථරයක් ලෙස ජෛව පරිසරය ව්‍යාප්තව ඇත

- **අජෛව පරිසරය**

සංරචක ලෙස වායුගෝලය, දේශගුණය, පාෂාණ, පස්, භූ රූප, සාගර හා මිරිදිය ජලය ආදිය ඇතුළත් වේ .මිනිසා විසින් මිහිතලය මත බිහි නොකළ සියලු දෑ හා මානව නොවන්නා වූ සියල්ල අජෛව පරිසරයට අයත් වේ .

- **සමාජ පරිසරය**

සමාජ පරිසරය මිනිසාගේ මැදිහත්වීමෙන් ගොඩනැගේ .

උදාහරණ- ආගම, කුලය, පන්තිය ,සදාචාරය, සිරිත් විරිත්


# ස්වාභාවික පරිසරයට අයත් ප්‍රපංච


- වනාන්තර
- කඳු පන්ති
- සත්වයින්
- ශාක වර්ග
- පාංශු පැතිකඩ
- හිරු එළිය
- ගංගාවල්






# ස්වාභාවික පරිසරයට ඇතුළත් සංසිද්ධීන්









කාබන් චක්‍රය

ජල චක්‍රය

# ඛනිජ චක්‍රය

# ආහාර දාම





- මිනිසා හා පරිසරය අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී .
- මිනිසාගේ පැවැත්මට ස්වාභාවික පරිසරය අත්‍යවශ්‍ය වේ.
- ආහාර නිපදවා ගැනීමට භෞතික පරිසරය අවශ්‍ය වේ .
- පරිසරයෙන් තොරව මිනිසාට පැවැත්මක් නොමැත .
- මිනිසා ද පරිසරයේ කොටසකි.

## <u>පරිසරයෙන් ලැබෙන සේවාවන්</u>

1.ජීව උපකාරක සේවා ( life support services )

2. ආර්ථික උපකාරක සේවා

   (economic  support service)

3.අපද්‍රව්‍ය අවශෝෂණ සේවා

   (garbage absorb service)


# පාරිසරික ගැටලු

ශාක හා සත්ත්ව ප්‍රජාවේ පැවැත්මට අහිතකර අන්දමින් පරිසර තත්ත්ව වෙනස් වීම පාරිසරික ගැටලු ලෙස හැඳින්වේ.

1. ස්වාභාවික සංසිද්ධීන් ඇසුරින් පරිසරයට සිදුවන ගැටලු
2. මිනිසා මූලික වීමෙන් ඇති වී ඇති පාරිසරික ගැටලු

# ස්වාභාවික සංසිද්ධීන් ඇසුරින් භෞතික පරිසරයට සිදුවන හානි

පෘථිවි ගෝලයේ ස්වභාවික තුලනයන් සඳහා බලපාන සංසිද්ධීන් මගින් ද පාරිසරික  ගැටලු ඇතිවේ.




උදාහරණ:    භූමිකම්පා
නායයාම්
ගිනිකඳු පිපිරීම්
ලැව්ගිනි
හිම කඳු කඩාවැටීම
ජල ගැලීම්
නියඟ ,සුළි කුණාටු, සුනාමි

# මිනිසා මූලික වීමෙන් ඇති වී ඇති පාරිසරික ගැටලු

## 1. ජල ගෝලයට සිදුවන හානි සහ ඒ සඳහා වන මානව බලපෑම

උදාහරණ :

- කර්මාන්තශාලාවල අපද්‍රව්‍ය ජලයට මුදාහැරීම .
- ජල මූලාශ්‍ර වලට හානි කිරීම .
- ජලය දූෂණය වීමෙන් ඇති වන පාරිසරික ගැටලු .
- ජල චක්‍රයේ  ක්‍රියාකාරීත්වයට බාධා ඇතිවීම
- පිරිසිදු ජලය ලබා ගැනීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීම .
- දූෂිත ජලය පානය මගින් ලෙඩ රෝග හා වසංගත පැතිරීම .

# 2. ශිලා ගෝලයට සිදුවන හානි හා ඒ සඳහා වන මානව බලපෑම

උදාහරණ : පතල් කැණීම මගින්

ඛනිජ තෙල් ,ගල් අඟුරු හා පස්, මිනිරන් වැනි විවිධ ඛනිජ වර්ග අසීමිත ලෙස ප්‍රයෝජනයට ගැනීම .



- ශිලා ගෝලයට සිදුවී ඇති හානි නිසා ඇති වන බලපෑම
- පරිසර සෞන්දර්ය විනාශ වී යාම
- භූමි හායනය
- ජල ගැලීම් ඇති වීම
- ජල මූලාශ්‍ර විනාශ වී යාම





# 3.භූමි පරිභෝජනය සම්බන්ධයෙන් සිදුවන හානි හා ඒ කෙරෙහි වන මානව බලපෑම

භූමිය මත සිදුකරන ඉදිකිරීම්.

උදාහරණ :

- කර්මාන්ත
- මහාමාර්ග
- සංවර්ධන ව්‍යාපෘති
- කෘෂිකාර්මික කටයුතු සඳහා වන වැස්ම ඉවත් කිරීම .
- වගා කටයුතු සඳහා රසායන පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, කෘමිනාශක භාවිතය.
- දිරාපත් නොවන අපද්‍රව්‍ය පොළව මත බැහැර කිරීම් .
- කාර්මික අපද්‍රව්‍ය තැන්පත් කිරීම.



# 4. වායුගෝලය සම්බන්ධයෙන් සිදු වන හානිය ඒ කෙරෙහි වන මානව බලපෑම

උදාහරණ :

- කර්මාන්තශාලා සහ වාහන වලින් පිටවන දුම්
- ගොවිපල වලින් පිටවන  මීතේන් වායුව




දේශගුණය සම්බන්ධයෙන් ඇති කරන බලපෑම

කෘෂිකර්මය හා කර්මාන්ත හේතුකොටගෙන

උදාහරණ :

- වායු ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
- සාගර ජල මට්ටම ඉහළ යාම
- වර්ෂණ ක්‍රියාවලිය වෙනස් වීම

# 5.ජෛව පරිසරයට හා සමාජ පරිසරයට වන බලපෑම්

විවිධ මිනිස් ක්‍රියාකාරකම් මත ජෛවීය පරිසරය වෙනස් කිරීම

උදා: ජනාවාස ඉදිකිරීම ,වගා කටයුතු සඳහා බිම් හෙළි පෙහෙළි කිරීම.





## ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල

- ජෛව පරිසර තුලිතතාව බිඳ වැටීම
- ආවේණික ශාක හා සත්ත්ව ප්‍රජාවන් විනාශ වීම
- ජෛව පද්ධති න්ගෙ ක්‍රියාකාරීත්වය බිඳ වැටීම

උදා: ඔක්සිජන් චක්‍රය, කාබන් චක්‍රය, ජල චක්‍රය

- ආක්‍රමණශීලී ශාක හා සත්ත්ව ප්‍රජා බිහිවීම

# සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල

- සමාජ සබඳතා බිඳ වැටීම
- ආගමික හා වාර්ගික ගැටුම් ඇතිවීම
- සමාජ අසාධාරණකම් සිදුවීම
- පවුල් සංස්ථා බිඳ වැටීම
- සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම





# පරිසරය හා සම්බන්ධ රජයේ වගකීම් හා යුතුකම්

- ජාතික පරිසර පනතට අනුකූලව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම පරිසර බලපෑම් තක්සේරු කිරීම, පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.
- පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම.
- පරිසරය හා සම්බන්ධ නීති රාමුවට අනුකූලව කටයුතු කිරීමට පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීම.
- රටේ නිෂ්පාදන හා කර්මාන්ත අංශය හරිත ඵලදායිතා සංකල්පය වෙත යොමු කිරීම.
- කලින් කලට පරිසරයේ අවශ්‍යතා සලකා බලා ජාතික හා ප්‍රාදේශීය වශයෙන් ගත යුතු වැදගත් තීරණ මගින් පරිසරය සුරැකීම.

# පරිසරය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම්

- පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය
- නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීමෙන් වැළකීම
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය
- පරිසර නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම
- සෑම විටම පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම


# සංවර්ධනය

මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

## සංවර්ධනය යන සංකල්පය පිළිබඳව ඇති නිර්වචන

රටක දිළිඳු බව අවසන් වී සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා වැඩිවී ආදායම් බෙදී යාමේ විෂමතා ඉවත් වේ නම් එය සංවර්ධනයයි.

- ඩඩ්ලි සියර්ස්-



නිමැවුම වැඩිවීමත් නිමැවුම් වැඩිවීමට තුඩු දුන් ශිල්පීය ක්‍රම හා ආයතනික  සංවිධාන වල දියුණුවත් සංවර්ධනයයි.

**-කිංඩල්බර්ග්-**

සංවර්ධනය යනු ජන සංඛ්‍යාව  සමාජීය සංස්කෘතික හා සදාචාරාත්මක යන සාධක ද ඇතුළත් වෙනස්වීම් හා වර්ධනය පිළිබඳ ක්‍රියාදාමයකි.

**-එක්සත් ජාතීන්ගේ සංවිධානය 1981-90 සංවර්ධන දශකය-**

# සංවර්ධනය මැනීම

රටක් අත්පත් කරගෙන ඇති ආර්ථික ප්‍රගතිය හා මට්ටම සලකා බැලීම සඳහා එය මැනීමට ලක් කළ යුතුය.

# සංවර්ධනය මැනීමේ පරමාර්ථ

- එකම රටක විවිධ අවධි වල පවතින සංවර්ධන විෂමතා හඳුනා ගැනීම .
- රටක දක්නට ලැබෙන ආර්ථික සමාජ හා සදාචාරාත්මක ගැටලු හඳුනාගැනීම.
- හඳුනාගත් ගැටලු අවම කර ගැනීමට ක්‍රියා මාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම .
- රටේ ආර්ථික ,සමාජ ,සංස්කෘතික හා සදාචාරාත්මක දියුණුව සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- වෙනත් රටවල් සමග සංවර්ධන මට්ටම සැසඳීම.
- ඉදිරි වර්ෂය සඳහා ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම.

# සංවර්ධන මිනුම්

1. සාම්ප්‍රදායික මිනුම්
2. නූතන මිනුම්



## සාම්ප්‍රදායික මිනුම්

- දළ ජාතික නිෂ්පාදිතය
- ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
- මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
- ආර්ථික වර්ධන වේගය

# නූතන මිනුම්



- භෞතික ජීවන තත්ව දර්ශකය
- මානව සංවර්ධන දශකය
- මානව දරිද්‍රතා දර්ශකය
- මානව පීඩන දර්ශකය
- බහුමාන දරිද්‍රතා දර්ශකය
- දුරකථන ඝනත්වය
- අන්තර්ජාල භාවිතය
- වෙළෙඳපොළ ව්‍යුහයේ වෙනස්කම්
- අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය
- පරිගණක සාක්ෂරතාව
- හරිත දළ දේශීය නිශ්පාදිතය
- සාම්ප්‍රදායික මිනුම්
- ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය =දළ ජාතිකනිෂ්පාදිතය
- මධ්‍ය වාර්ෂික ජනගහනය

# සාම්ප්‍රදායික මිනුම්

$$\text{ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය} = \frac{\text{දළ ජාතික නිෂ්පාදිතය}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}}$$

$$\text{දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය} = \frac{\text{අදාළ වසරේ දළ ජාතික නිෂ්පාදිතය} - \text{පසුගිය වසරේ දළ ජාතික නිෂ්පාදිතය}}{\text{පසුගිය වසරේ දළ ජාතික නිෂ්පාදිතය}} \times 100$$

# නූතන මිනුම් හා ඒවාට අදාළ සංරචක

| මිනුම | සංරචක |
| --- | --- |
| භෞතික ජීවන තත්ව දර්ශකය PQLI | • සාක්ෂරතාව<br>• ළදරු මරණ අනුපාතය<br>• උපතේදී ආයු අපේක්ෂාව |
| මානව සංවර්ධන දර්ශකය HDI | • ආයු අපේක්ෂණ දර්ශකය<br>• අධ්‍යාපන දර්ශකය<br>• ආදායම් දර්ශකය |

# සංවර්ධනය මැනීම සඳහා භාවිත වන මිනුම් වල කාර්යක්ෂම බව

## ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ අඩුපාඩු

- ආර්ථිකමය තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම
- සමාජමය තත්වය පෙන්නුම් නොකිරීම
- ආදායම් බෙදීයාමේ විෂමතාව පෙන්නුම් නොකිරීම
- සමාජ සුබසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීම

- ❑ සමාජ සංවර්ධනය මැනීම සඳහා නූතන මිනුමක් ලෙස භෞතික ජීවන තත්ව දර්ශකය යොදා ගනී. මෙය සංවර්ධනය මැනීමේදී ඒක පුද්ගල ආදායමේ ඌන පූරකයක් ලෙස භාවිත වේ.
- ❑ මානව සංවර්ධන දර්ශකය ආර්ථික හා සමාජ යන අංග දෙකම මැන ගැනීමට උපකාරී වේ.

# සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට නිදසුන් හා එම රටවල ලක්ෂණ


| සංවර්ධිත රටවල් | සංවර්ධිත රටවල ලක්ෂණ |
|---|---|
| • නොර්වේ<br>• ස්වීඩනය<br>• කැනඩාව<br>• ජපානය<br>• ඇමරිකා එක්සත් ජනපදය<br>• ඕස්ට්‍රේලියාව | • ඒක පුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් 3500ක ට වැඩි වීම.<br>• භෞතික ජීවන තත්ත්ව දර්ශකය 90 ට වඩා වැඩි වීම.<br>• ජනසංඛ්‍යා වර්ධනය පහළ මට්ටමක පැවතීම.<br>• ඉහළ සාක්ෂරතා ප්‍රතිශතයක් පැවතීම.<br>• ළදරු මරණ අනුපාතය අඩු වීම.<br>• මානව සංවර්ධන දර්ශකය 0.80ට වඩා වැඩි වීම. |

| සංවර්ධනය වෙමින් පවතින රටවල් | සංවර්ධනය වෙමින් පවතින රටවල දක්නට ලැබෙන ලක්ෂණ |
| --- | --- |
| • ඉන්දියාව<br>• නේපාලය<br>• භූතානය<br>• ඉතියෝපියාව<br>• සෝමාලියාව | • භෞතික ජීවන තත්ව දර්ශකය පහළ මට්ටමක පැවතීම<br>• ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 3500 කට වඩා අඩු වීම<br>• මානව සංවර්ධන දර්ශකය පහළ මට්ටමක පැවතීම<br>• ජනසංඛ්‍යා වර්ධන වේගය ඉහළ මට්ටමක පැවතීම<br>• මානව සංවර්ධන දර්ශකය 0.50ට වඩා අඩු වීම |

| සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලු | සංවර්ධනය වෙමින් පවත්නා රටවල් මුහුණ පාන ගැටලු |
| --- | --- |
| • පරිසර දූෂණය<br>• අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා<br>• ඛනිජ තෙල් මිල ඉහළ යාම<br>• නිමි ද්‍රව්‍ය අලෙවි කර ගැනීම පිළිබඳ අපහසුතා<br>• ජාත්‍යන්තර ත්‍රස්තවාදය | • පරිසර දූෂණය<br>• නිෂ්පාදිත අමුද්‍රව්‍ය සඳහා හොඳ මිලක් නොලැබීම<br>• අවාසිදායක වෙළඳ ශේෂය<br>• ප්‍රාග්ධන හිඟය<br>• විරැකියාව<br>• දේශපාලන අස්ථාවරත්වය<br>• බලශක්ති අර්බුදය |

# සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ විශේෂත්වය


- සංවර්ධිත රටවලට සාපේක්ෂව බලන විට ඉහළ සාක්ෂරතා මට්ටමක් පැවතීම
- ළදරු මරණ, මාතෘ මරණ අනුපාතය පහළ මට්ටමක පැවතීම
- ජීවන අපේක්ෂාව ඉහළ මට්ටමක පැවතීම




# ශ්‍රී ලංකාව සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු

- ප්‍රාග්ධන ඌනතාව
- ප්‍රාථමික භාණ්ඩ වල මිල උච්චාවචනය
- ආනයනය කරන භාණ්ඩ සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදු වීම
- අවාසිදායක වෙළඳ ශේෂය
- අන්තර් ජාතික වෙළදාමේදී සංවර්ධිත රටවල් අනුගමනය කරන ආරක්ෂණ පිළිවෙත්. උදාහරණ: තීරුබදු ,සලාක ක්‍රම
- බලශක්ති අර්බුදය
- බුද්ධි ගලනය (බුද්ධිමතුන් විදේශගත වීම)

# දිළිඳු බවේ විෂම චක්‍රය



# සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ පාන ගැටළු සඳහා විසඳුම්

- විදෙස් ආධාර ලබා ගැනීම
- දේශීය ඉතුරුම් සඳහා දිරිගැන්වීම
- අපනයන විවිධාංගීකරණය
- නව වෙළෙඳපොළ සොයා ගැනීම
- ආයාත ආදේශන ප්‍රතිපත්ති අනුගමනය කිරීම
- විකල්ප බලශක්ති හඳුන්වාදීම හා භාවිතයට යොමු වීම

# තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධනය යනු අනාගත පරපුරේ අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා අහිමි නොකර වර්තමාන සංවර්ධන ක්‍රියාවලිය ප්‍රශස්ත අයුරින් පවත්වාගෙන යාමයි .

# තිරසර සංවර්ධනයේ වැදගත්කම හා අවශ්‍යතාව

- පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් කටයුතු කිරීම නිසා සුබසාධන කාර්යන්ට අඩු වැදගත්කමක් හිමි වීම

  උදා: ** නිෂ්පාදිත වාණිජකරණය වීම තුළ ලාභ අපේක්ෂාවෙන් කටයුතු කිරීම නිසා අහිතකර නිෂ්පාදන වෙළෙඳ පොළට ගලායෑම.

  ** ආර්ථික හා ඉලක්ක සපුරා ගැනීමට යාම තුළ පරිසරය නොසලකා හැරීම

- කෙටිකාලීනව අවශ්‍යතා සපුරා ගැනීමට පෙළඹීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල.

  උදා: වනාන්තර විනාශ වීම, සම්පත් අධි පරිභෝජනය, නල ළිං ඉදිකිරීම

- සංවර්ධන ක්‍රියාවලියේ දී ආර්ථික සංවර්ධනය ,පරිසර සමතුලිතතාව හා එක්ව ගමන් නොකිරීම

- පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රමවේද යොදා නොගැනීම

  උදා:කර්මාන්ත ශාලාවලින් පිටවන දුම්, අපවිත්‍ර ජලය පරිසරයට මුදා හැරීම

- සමාජ පිරිවැය ඉහළ යාම .


  උදා: අපද්‍රව්‍ය අවිධිමත්ව පරිසරයට මුදා හැරීම

# තිරසර සංවර්ධනය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

- සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පරිසර හානිය අවම වන අන්දමින් සැලසුම් කිරීම
- පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිපදවීමට නිෂ්පාදකයන් දිරිගැන්වීම
- පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා පරිභෝජනය වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම
- පරිසර සංරක්ෂණයට අදාල  නීති සම්පාදනය
- තිරසාර සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම
- අධි පරිභෝජනය සීමා කර පරිසර හිතකාමී ජීවන ක්‍රමයකට ජනතාව යොමු කිරීම

THE GLOBAL GOALS
For Sustainable Development

# සම්පත් වල ඵලදායිතාව දියුණු කිරීමට යොදා ගන්නා ලෝකයේ භාවිත වන උපායමාර්ග




- 5S ඵලදායිතා සංකල්පය භාවිතය
- CP සුපිරිසිදු නිෂ්පාදනය
- GP හරිත ඵලදායිතාව
- TQM පූර්ණ ගුණාත්මක කළමනාකරණය
- Poka Yoke වැරදි ශූන්‍ය කිරීම
- pPP බැහැර කිරීමේ වගකීම නිෂ්පාදකයාට පැවරීම

# තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්

- පරිසර හිතකාමී ජීවන රටාවකට හුරුවීම
- අධි පරිභෝජනයෙන් වැළකීම
- පරිසර හිතකාමී ආකල්ප වර්ධනය කර ගැනීම
- නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම
- භෞතික පරිසරයට හානිකර ක්‍රියාකාරකම් වලින් වැළකීම
- සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය
- තිරසර සංවර්ධනයේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ සමාජය දැනුවත් කිරීම

# තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් විවිධ ආයතනවල හා සංවිධානවල වගකීම් හා යුතුකම්

- පරිසර හානි පිළිබඳ සංවේදී වීම ,ඒ පිළිබඳ සොයා බැලීම, තොරතුරු රැස් කිරීම හා අදාල ඒ පිළිබඳ වගකිව යුතු ආයතන දැනුම්වත් කිරීම .
- තිරසර සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම .
- සරල දිවි පැවැත්මට අදාළ සිතුම් පැතුම් හා චර්යා සමාජගත කිරීමට දායක වීම .
- මිනිස් පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ හා සේවා පරිහරණය අවම කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම .

# තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් රජයේ වගකීම හා යුතුකම්

- පරිසරය සුරැකීම පිළිබඳව ජනතා දැනුම ආකල්ප හා කුසලතා සංවර්ධනයට පියවර ගැනීම .
- දිළිඳුකම පිටුදැකීම සඳහා පියවර ගැනීම .
- නිෂ්පාදනය බෙදා හැරීම හා පරිභෝජනය සම්බන්ධයෙන් පවතින අසමතුලිතතා අවම කිරීම .
- තිරසර සංවර්ධනයට දායකවන ඵලදායි පාරිසරික නීති රීති හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- පරිසර හිතකාමී නොවන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අවම කිරීමට කටයුතු කිරීම .

**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 3 | 04. පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය<br>----ඇගයීම---- |

**සැකසුම - එස්.ඒ.ඩී. චතුරි සමරවීර**
**බප/හො/ දොන් පේද්‍රික් මහා විද්‍යාලය**

1. ස්වාභාවික පරිසරයට අයත් සංසිද්ධීන් දෙකක් නම් කරන්න.
2. පරිසරයෙන් අපට ලැබෙන සේවාවන් තුනක් ලියන්න.
3. පාරිසරික ගැටලු ඇති වීමට බලපාන ස්වාභාවික හේතූන් තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න .
4. වනාන්තර (වන) හායනයට බලපාන හේතු දෙකක් නම් කරන්න .
5. වන හායනය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න .
6. ශිලා ගෝලයට සිදුවී ඇති හානි නිසා ඇති වී තිබෙන අහිතකර බලපෑම් තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න .
7. වායු දූෂණයට බලපාන හේතු දෙකක් නම් කරන්න .
8. වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න .
9. සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න .
10. දේශගුණය වෙනස් වීම් නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල දෙකක් නම් කරන්න .
11. පරිසරය සුරැකීම සඳහා පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න .
12. ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න .
13. රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ දෙකක් නම් කරන්න .
14. සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන සම්ප්‍රදායික මිනුම් තුනක් නම් කරන්න .
15. සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන නූතන මිනුම් තුනක් නම් කර ඉන් එක් මිනුමක් පිළිබඳ විස්තර කරන්න .

16. සංවර්ධනය වන රටවල් මුහුණපාන ගැටලු දෙකක් නම් කරන්න .

17. සංවර්ධිත රටවල් මුහුණ පාන ගැටලු තුනක් නම් කරන්න .

18. සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ පාන ගැටලු සඳහා විසඳුම් තුනක් නම් කරන්න .

19. ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජය ගැනීම සඳහා අනුගමනය කරන පියවර තුනක් නම් කරන්න .

20. තිරසර සංවර්ධනය ලඟාකරගැනීමට ජයගත යුතු අභියෝග තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න .

**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 3 | 04. පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය<br>----පිළිතුරු---- |

**සැකසුම - එස්.ඒ.ඩී. චතුරි සමරවීර**
**බප/හො/ දොන් පේද්‍රික් මහා විද්‍යාලය**

1.කාබන් චක්‍රය,ජල චක්‍රය,ඛනිජ චක්‍රය ,ආහාර දාම

2. ජීව උපකාරක සේවා ,ආර්ථික උපකාරක සේවා, අපද්‍රව්‍ය අවශෝෂණ සේවා

3.අධික වර්ෂාව ,භූමි කම්පා,නියඟය ,ගංවතුර ,සුනාමි,ගිනිකඳු පිපිරීම් ,සුළි කුණාටු

4. ගිනිකඳු පිපිරීම ,ලැව්ගිනි,දූවිලි කුණාටු

5. කර්මාන්ත වලින් පිට කරන අපද්‍රව්‍ය ,කෘෂිකාර්මික කටයුතු සඳහා යොදන රසායන ද්‍රව්‍ය ජලයට එක්වීම ,කුණු කසළ හා අපද්‍රව්‍ය ජලයට එක්වීම .

6. පරිසර සෞන්දර්යය විනාශ වීම, භූමි හායනය, ජල ගැලීම් ඇති වීම, පස නිසරු වීම

7. ගිනිකඳු පිපිරීම, ලැව්ගිනි, දූවිලි කුණාටු, කර්මාන්තශාලා, ප්‍රවාහන කටයුතු, ගුවන් යානා භාවිතය

8. ගෝලීය උණුසුම් වීම, ඕසෝන් ස්ථරයට හානි වීම, අම්ල වැසි ඇති වීම, දූවිලි වලා ඇතිවීම ,දේශගුණික විපර්යාස ඇතිවීම

9. සමාජ සබඳතා බිඳ වැටීම ,ආගමික හා වාර්ගික ගැටුම් ඇතිවීම ,සමාජ අසාධාරණකම් සිදුවීම ,පවුල් සංස්ථා බිඳ වැටීම

10. ලෝකයේ සාමාන්‍ය උෂ්ණත්වය ඉහළ යාම ,වර්ෂණ ක්‍රියාවලිය වෙනස් වීම ,හිම හා අයිස් වැස්ම දිය වී යාම ,සාගර ජල මට්ටම ඉහළ යෑම

11. පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය ,නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම ,පරිසර නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම

12. ජෛව පරිසර තුලිතතාව බිඳ වැටීම ,ආවේණික ශාක හා සත්ත්ව ප්‍රජාවන් විනාශ වීම ,ජෛව පද්ධතියේ ක්‍රියාකාරීත්වය බිඳ වැටීම ,ආහාර දාම හා ආහාර ජාල දාම බිඳ වැටීම

13.සංවර්ධන විෂමතා හඳුනා ගැනීමට ,සංවර්ධන ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා ,ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා

14. දළ ජාතික නිෂ්පාදිතය ,ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ,මූර්ත දළ ජාතික නිෂ්පාදිතය

15. භෞතික ජීවන තත්ව දර්ශකය ,මානව සංවර්ධන දර්ශකය ,මානව දරිද්‍රතා දර්ශකය ,මානව පීඩන දර්ශකය

16. ප්‍රාග්ධන හිඟය,අවාසිදායක වෙළඳ ශේෂය ,ප්‍රාථමික භාණ්ඩ මිල උච්චාවචනය

17.පරිසර දූෂණය ,ජාත්‍යන්තර ත්‍රස්තවාදය ,බලශක්ති අර්බුදය ,වෙළඳපොල තරඟය

18.දේශීය ඉතුරුම් සඳහා දිරි ගැන්වීම ,අපනයන විවිධාංගීකරණය ,නව වෙළඳපොළ සොයා ගැනීම,කලාපීය සංගම් ඇති කර ගැනීම

19.දේශීය ඉතුරුම් දිරිගැන්වීම ,විදේශීය ණය ලබා ගැනීම ,අපනයන විවිධාංගිකරණය, දේශපාලන ස්ථාවරත්වය ගොඩනැගීම

20.ආකල්ප සංවර්ධනය,සමාජ සහභාගීත්වය ලබා ගැනීම,පරිසර හිතකාමී ලෙස සම්පත් පරිභෝජනයට යොමු වීම